# 7 ශ්‍රේණිය සිංහල -2022

## 04 ඒකකය

# ඔයි රයිරේ ඔයි රාමා



**සැකසුම - හසිත හෙට්ටිආරච්චි**
**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

07 ශ්‍රේණිය පෙළ පොත අභ්‍යාස සහ පිළිතුරු ද ඒකකයට අදාළ ආදර්ශ ප්‍රශ්න පත්‍ර 03ක් සහ පිළිතුරු ද අන්තර්ගත කර ඇත.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# ౦4. බසි රසිගේ බසි රාමා



විවිධ හේතු නිසා විවිධ වූ ව්‍යවහාර රැසක් සිංහල භාෂාවට එකතු වී ඇත. උදා -

- ✓ භූගෝලීය සාධක
- ✓ පාරිසරික විශේෂතා
- ✓ නිෂ්පාදන ක්‍රම
- ✓ ඇදහිලි හා විශ්වාස
- ✓ සිතුම් පැතුම්
- ✓ ජීවන ක්‍රම

'වී' බුද්ධ භෝගයක් ලෙස සැලකේ. කමත හා වී අතර බුදුන් වහන්සේගේ හා දෙවියන්ගේ සම්බන්ධතාවක් ඇතැයි සිංහලයෝ විශ්වාස කරති. වී ගොවිතැන හා බැඳුණු බස් වහර හා සිරිත් විරිත් මොනවා දැයි හඳුනා ගන්නට මේ පාඩම ඔබට උපකාරී වනු ඇත.

## අරුත් පැහැදිලි කිරීම (කමත් බස)

- ✓ බිස්ස - ධාන්‍ය තැන්පත් කර තැබීමට සකසන විශාල පෙට්ටිය
- ✓ උප්පිඩ - අතට හසු වන තරම් ප්‍රමාණයේ ගොයම් මිට
- ✓ පිරුවටය - පිරිසිදු සුදු රෙද්දක්
- ✓ මහප්පිඩ - කමතේ තබන මුල් ම උප්පිඩ

- ✓ ඇඳුත්ත - එකිනෙකාට ඇඳා ඇති හරක්
- ✓ ගොන් කණුව - කමතේ හරක් ගැට ගහන කණුව
- ✓ අඬහැරය - අම්බරුවන් දිරිමත් කරන හඬ ගෑම
- ✓ ගොම්පස් - ගොම
- ✓ මුත්තෙට්ටුව - කමත් ආහාරය/කමත් බත
- ✓ තහංචි - තහනම
- ✓ ඉපනැල්ල - ගොයම් කැපීමෙන් පසු ගොයම් ගසේ ඉතිරි කොටස
- ✓ කුඹල් ගෙඩිය - කළය/වතුර භාජනය
- ✓ ඇඹුල පේ කිරීම - කමතේ ආහාර බෙදීම ආරම්භ කිරීම
- ✓ අත්තම - උදව්වට වැඩ කර දීම
- ✓ සප්පායම - ආහාර අනුභව කිරීම
- ✓ හීල් අඩුක්කුව - උදේ ආහාරය
- ✓ සේදැරි කරනවා - ඉක්මන් කරනවා
- ✓ යතුර - කුල්ල/ යතුරු ගොයියාව
- ✓ රතු ගඟුල - තේ කහට
- ✓ රස බෝය - හකුරු
- ✓ පාවර - ගොයම් පෑගීමට පැදුරු එළා ඇති තැන
- ✓ කමත/ කලවිට - කොළ මඩවන මුළු බිම
- ✓ අරක් වළ - අරක් වස්තු තැන්පත් කරන්නට කමතේ හාරන වළ
- ✓ අරක් වස්තු - අරක් වළ මත තැන්පත් කරන්නට සූදානම් කර ඇති නිධන් වස්තු (කටු හක් බෙල්ලා, ඖෂධ පොට්ටනිය, බුලත් සහ පුවක්, යකඩ කෑල්ලක්/ ලියන්නාව)
- ✓ ගොන් කණුව - අරක් වළ මැද සිටුවන කණුව
- ✓ අරක් මුත්තා - ඖෂධ පොට්ටනිය
- ✓ අරක් බෙල්ලා - කටු හක් බෙල්ලා
- ✓ ලියන්නාව - දෑකැත්ත
- ✓ අළුහන් වඩනවා - පාවර ආරක්ෂා කිරීමට අළුවලින් අඳින චාරිත්‍රය/ කමත් යන්තරේ/ අටමගල/
- ✓ වට මළුව - ගොයම් ගොඩ/ ගොයම් කොළය
- ✓ බැත - වී
- ✓ බැත වඩනවා - කමත පුරා වී ඉහින චාරිත්‍රය
- ✓ බෝලත්ත - කමත අතු ගාන ඉදල
- ✓ අම්බරුවෝ - හරක්
- ✓ මුදුනා - ඇඳුත්තේ නායකයා. (ඊ ළඟට කොළමුත්තා. ඊ ළඟට එළිවිස්සා. ඊ ළඟට මට්ටයා. අන්තිමයා කලාතයා.)

- ✓ සාත්තු වෙනවා - කනවා
- ✓ රත්තා බෝ කිරීම - ගිනිමැළ ගැසීම
- ✓ පැඟිරි බෝය පිරීම - බුලත් විට කෑම
- ✓ ඇඹුල/ මුත්තෙට්ටුව - කමත් බත/ කමත් ආහාරය
- ✓ කළු ගගුල - කෝපි
- ✓ කිරි කබළු - ආප්ප
- ✓ මැඩුවන් - මැඩවුණු ගොයම
- ✓ දැති ගොයියාව - මැඩුවන් අවුස්සා දෙන කරුවක් ඇති ලීය
- ✓ මල් පාවර කරනවා - පළමුවෙනි මැඩුවන් හලා බෑම
- ✓ වට දානවා - කමත වටේ තුනී වී විසිරී ඇති ගොයම් පාවරට දැමීම
- ✓ මෝල්කඩ - අම්බරුවන් කමතට ඇතුළු වන පාර

## අවබෝධය

1. අනුරාධගේ නිවාඩුව ප්‍රීතිමත්ව හා ඵලදායීව ගත වන්නට හේතු වූ කරුණු මොනවා ද?
2. සිරිමල් අනුරාධට පැහැදිලි කර දුන්නේ කුමන කාර්යයක් ගැන ද?
3. පාවර රැක ගැනීම සඳහා කරන චාරිත්‍ර කෙටියෙන් පැහැදිලි කරන්න.
4. අත්තමට වැඩ කිරීම සඳහා කමතට පැමිණි දෙදෙනකු නම් කරන්න.
5. ආහාර පාන කිහිපයක් සඳහා විශේෂ යෙදුම් මේ පාඩමේ ඇතුළත් වේ. ඒ මොනවා ද?

- **අවබෝධය**

1.

- ✓ මාමාගේ පුතා වන සිරිමල් සමග සෙල්ලම් කිරීමට හැකි වීම.
- ✓ මාමලාගේ කුඹුරේ ගොයම් පෑගීම ද මෙදිනට ම යෙදී තිබීම.

2.

- ✓ අරක් වළ ගැන
- ✓ ගොම්පස් අල්ලා ඒවා පාවරට වැටීම වළක්වා කමතෙන් පිටතට වීසි කරන ආකාරය
- ✓ මල් පාවර කිරීම ගැන ...

3.

- ✓ අරක් වළ මත නිදන් වස්තු තැන්පත් කිරීම.
- ✓ අළුවලින් ඇදීම/ කමත් යන්තරේ/ අටමගල/ අළුහන් වැඩීම.
- ✓ වී කරල් අතින් පොඩි කර ගොයමින් වෙන් කර ගත් වී ඇට කමත පුරා ඉසීම/ බැත වැඩීම.
- ✓ බෝලත්තෙන් කමත අතු ගා කහ වතුර ඉසීම.

4.

- ✓ සාදිරිස් උන්නැහේ
- ✓ විලියම් මාමා

5.

- ✓ රතු ගගුල
- ✓ රස බෝය
- ✓ ඇඹුල/ මුත්තෙට්ටුව
- ✓ හීල් අඩුක්කුව
- ✓ කළු ගගුල
- ✓ කිරි කබළු

## ලිඛිත අභ්‍යාස

1. 'අ' තීරුව හා 'ආ' තීරුව යා කරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| ගොන්කාරයෝ | ඉක්මන් කරනවා |
| අරක් මුත්තා | ඇඳුත්තේ අන්තිමයා |
| සේදැරි කරනවා | මැඩවීම |
| මුත්තෙට්ටුව | අම්බරුවන් දක්කන්නෝ |
| රත්තා බෝ කිරීම | බුලත් විට කනවා |
| මල් පාවර කිරීම | අරක් වළෙහි තැන්පත් කරන ඖෂධ පොට්ටනිය |
| පැගිරි බෝය පුරනවා | උදේ ආහාරය |
| කලාතයා | කමත් බත |
| කොළ ගොන් ගැහීම | මුල් ම මැඩුවත් හැලීම |
| හීල් අඩුක්කුව | ගිනිමැළ ගැසීම |

3. කමත් භාෂාවේ පහත සඳහන් යෙදුම් සඳහා සාමාන්‍ය ව්‍යවහාරයේ යෙදෙන පද ලියන්න.

i. යතුර -
ii. බැත -
iii. කෙවිට -
iv. කළු ගගුල -
v. රස බෝය -
vi. ලියන්නාව -
vii. කුඹල් ගෙඩිය -
viii. ඇඹුල -
ix. මැඩුවන් -
x. පැගිරි බෝය -
xi. ගොම් පස් -
xii. සප්පායම -
xiii. සේදැරි -
xiv. කිරි කබළ -

- ## ලිඛිත අභ්‍යාස

**1.**

'අ'

- ගොත්කාරයෝ
- අරක් මුත්තා
- සේදැරි කරනවා
- මුත්තෙට්ටුව
- රත්තා බෝ කිරීම
- මල් පාවර කිරීම
- පැගිරි බෝය පුරනවා
- කලාතයා
- කොළ ගොන් ගැහීම
- හීල් අඩුක්කුව

'ආ'

- ඉක්මන් කරනවා
- ඇඳුත්තේ අන්තිමයා
- මැඩවීම
- අම්බරුවන් දක්කන්නෝ
- බුලත් විට කනවා
- අරක් වළෙහි තැන්පත් කරන ඖෂධ පොට්ටනිය
- උදේ ආහාරය
- කමත් බත
- මුල් ම මැඩුවන් හැලීම
- ගිනිමැළ ගැසීම

**2.**

i. යතුර - කුල්ල
ii. බැත - වී
iii. කෙවිට - කෝටුව
iv. කළු ගගුල - කෝපි
v. රස බෝය - හකුරු
vi. ලියන්නාව - දෑකැත්ත
vii. කුඹල් ගෙඩිය - කළය/වතුර භාජනය
viii. ඇඹුල - කමත් බත

ix. මැඩුවන් - මැඩවුණු ගොයම
x. පැඟිරි බෝය - බුලත් විට
xi. ගොම් පස් - ගොම
xii. සප්පායම - ආහාර ගැනීම
xiii. සේදැරි - ඉක්මන්
xiv. කිරි කබළු - ආප්ප

## ප්‍රායෝගික අභ්‍යාස (Home Work)

**ප්‍රායෝගික අභ්‍යාස**

1. පාඩමෙහි ඔබ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නගන්න.
2. කමතේ දී භාවිත කෙරෙන විශේෂ යෙදුම් පිළිබඳව බිත්ති පුවත්පතට ලිපියක් සකස් කරන්න.

# නාම පද

- සචේතනික හා අචේතනික සියලු වස්තු හඳුන්වන පද 'නාම පද' නම් වේ.
- නාම පද කෙරෙහි, වචන භේදය/ සංඛ්‍යා භේදය, හා ලිංග භේදය බලපායි.

## I. වචන භේදය (සංඛ්‍යා භේදය)

✓ මෙහි දී එක් අයකු හෝ එක් දෙයක් හෝ හැඳින්වෙන නාම පද ඒක වචන නාම පද ලෙසත් එක් දෙයකට වැඩියෙන් ඇති දේවල් හෝ එක් අයෙකුට වැඩියෙන් සිටින කණ්ඩායමක් හෝ හැඳින්වීමට යොදන නාම පද, බහු වචන නාම පද ලෙසත් හැඳින්වේ.

✓ ඒක වචන නාම පදයක් බහු වචන නාම පදයක් බවට හරවා ගැනීමට ක්‍රම කීපයක් ඇත.

**1.** ක්‍රමය.

උදා -
අම්මා - අම්මලා
මාමා - මාමලා
අයියා - අයියලා
පුතා - පුත්තු
නැන්දා - නැන්දලා
අක්කා - අක්කලා

**2. ක්‍රමය.**

| | | | |
|---|---|---|---|
| උදා - | කුඹුර | - | කුඹුරු |
| | යතුර | - | යතුරු |
| | පැදුර | - | පැදුරු |
| | සිදුර | - | සිදුරු |
| | කතුර | - | කතුරු |

**3. ක්‍රමය.**

| | | | |
|---|---|---|---|
| උදා - | කමත | - | කමත් |
| | ගොයම | - | ගොයම් |
| | බුලත | - | බුලත් |
| | සිරිත | - | සිරිත් |
| | ඇස | - | ඇස් |
| | පහන | - | පහන් |

**4. ක්‍රමය.**

| | | | |
|---|---|---|---|
| උදා - | චාරිත්‍රය | - | චාරිත්‍ර |
| | යන්ත්‍රය | - | යන්ත්‍ර |
| | පිරුවටය | - | පිරුවට |
| | බංකුව | - | බංකු |
| | පිළිමය | - | පිළිම |

**5. ක්‍රමය.**

| | | | |
|---|---|---|---|
| උදා - | කුල්ල | - | කුළු |
| | මල්ල | - | මළු |
| | දල්ල | - | දළු |

**6. ක්‍රමය.**

| | | | |
|---|---|---|---|
| උදා - | වළ | - | වළවල් |
| - | මෝල්කඩ | - | මෝල්කඩවල් |
| | දොර | - | දොරවල් |
| | පාර | - | පාරවල් |

**7. ක්‍රමය.**

| | | | |
|---|---|---|---|
| උදා - | අඩුක්කුව | - | අඩුක්කු |
| | කඩාඩුව | - | කඩාඩු |
| | හෙප්පුව | - | හෙප්පු |
| | සේප්පුව | - | සේප්පු |

**8. ක්‍රමය.**

| | | | |
|---|---|---|---|
| උදා - | අම්බරුවා | - | අම්බරුවෝ |
| | මදුරුවා | - | මදුරුවෝ |
| | බල්ලා | - | බල්ලෝ |
| | දරුවා | - | දරුවෝ |

## ලිඛිත අභ්‍යාස

1. එක් එක් ක්‍රමය යටතේ ඒක වචන නාම පද පහ බැගින් ලියා ඒවා බහු වචන නාම පද බවට හරවා ලියන්න.

2. පහත සඳහන් වගුවෙහි හිස් තැන්වලට සුදුසු පද යොදා වගුව සම්පූර්ණ කරන්න.

| ඒක වචන | බහු වචන |
|---|---|
| සිංහයා | ........................... |
| .................................. | ලේන්නු |
| .................................. | පොත් |
| අක්කා | ........................... |
| කඩය | ........................... |
| .................................. | පතුරු |
| .................................. | කවර |
| පෙට්ටිය | ........................... |
| දවටනය | ........................... |
| .................................. | මහල්ලෝ |

3. ත්‍රිකෝණය තුළ ඇති නාම පද ඒක වචන හා බහු වචන යනුවෙන් වර්ග කර වගුවක ඇතුළත් කරන්න.

මම
කරාබුව
තොපි, ගවුම
වහලය, පුටු, පැන
පත්තර, ඉබ්බෝ, ගෙවල්
කණ්ණාඩි, සණ්ටාරය
කම්කරුවෝ, ගුරුතුමිය, වලාකුළ
ලේඛකයෝ, කර්තෘ, අට්ටාල, තරු
නිවේදකයා, ක්‍රීඩකයෝ, පොත්, අල්මාරි
කතුරු, වට්ටිය, පෙදරේරුවෝ, කළමනාකරු

- ලිඛිත අභ්‍යාස

1.

I. අක්කා - අක්කලා
නංගී - නංගිලා
නැන්දා - නැන්දලා
සීයා - සීයලා
බාප්පා - බාප්පලා

II. කතුර - කතුරු
අකුර - අකුරු
පතුර - පතුරු
අතුර - අතුරු
පොකුර - පොකුරු

III. ගවුම - ගවුම්
පොත - පොත්
විරිත - විරිත්
ඉටිපන්දම - ඉටිපන්දම්
මල - මල්

IV. මන්ත්‍රය - මන්ත්‍ර
මාලය - මාල
වැසිකිළිය - වැසිකිළි
පුස්තකාලය - පුස්තකාල
ද්වටනය - ද්වටන

V. මල්ල - මලු
තල්ල - තලු
වලාකුළ - වලාකුළු
වළල්ල - වළලු
මුල්ල - මුලු

VI. ගෙදර - ගෙවල්
දොර - දොරවල්
දොළ - දොළවල්
ඇළ - ඇළවල්
පාර - පාරවල්

VII. පුටුව - පුටු
දරණුව - දරණු
පෝරණුව - පෝරණු
ඔරුව - ඔරු
කණුව - කණු

VIII. මාළුවා - මාළුවෝ
පෙදරේරුවා - පෙදරේරුවෝ
කම්කරුවා - කම්කරුවෝ
බල්ලා - බල්ලෝ
ලේඛකයා - ලේඛකයෝ
ඉබ්බා - ඉබ්බෝ

2.

I. සිංහයා - සිංහයෝ
II. ලේනා - ලේන්නු
III. පොත - පොත්
IV. අක්කා - අක්කලා
V. කඩය - කඩ
VI. පතුර - පතුරු
VII. කවරය - කවර
VIII. පෙට්ටිය - පෙට්ටි
IX. දවටනය - දවටන
X. මහල්ලා - මහල්ලෝ

3.

I. ඒක වචන - මම, කරාබුව, ගවුම, වහලය, පෑන, ඝණ්ටාරය, ගුරුතුමිය, වලාකුළ, කර්තෘ, නිවේදකයා, වට්ටිය, කළමනාකරු

II. බහු වචන - තොපි පුටු, පත්තර, ඉබ්බෝ, ගෙවල්, කණ්ණාඩි, කම්කරුවෝ, ලේඛකයෝ, අට්ටාල, තරු, ක්‍රීඩකයෝ, පොත්, අල්මාරි, කතුරු, පෙදරේරුවෝ

## ප්‍රායෝගික අභ්‍යාස (Home Work)

**ප්‍රායෝගික අභ්‍යාස**

1. දිය ගොඩ ක්‍රීඩාව (ක්‍රීඩකයෝ දසදෙනෙකි.) දිය යනුවෙන් ඒක වචන ද ගොඩ යනුවෙන් බහු වචන ද හැඳින්වෙන බවට කණ්ඩායම ම තීරණය කරන්න. කණ්ඩායම් නායකයා ඒක වචන නාම පදයක් කියද්දී 'දිය' යනුවෙන් නාම පුවරුවක් ගසා ඇති කොටසට යා යුතු ය. බහු වචන නාම පදයක් කියද්දී 'ගොඩ' යනුවෙන් නාම පුවරුවක් ගසා ඇති කොටසට යා යුතු ය. අවධානයෙන් සිටියොත් ඔබ දිනුම්.
2. එක් එක් ක්‍රමය යටතේ ඒක වචන පද, බහු වචන පද බවට හරවා ලියන ලද නාම පද පුවරුවක් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.
3. බහු වචන පදයක් සකස් කර ගන්නා ක්‍රමවල දී ඒක වචන නාම පදය වෙනස් වන ආකාරය අවබෝධ කර ගන්නට උත්සාහ කරන්න. යහළුවන් සමග සාකච්ඡා කරන්න.

## II. පුරුෂ භේදය

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| උත්තම පුරුෂ | මම<br>මා | අපි<br>අප |
| මධ්‍යම පුරුෂ | නුඹ<br>තෝ | නුඹලා<br>තොපි/තෙප |
| ප්‍රථම පුරුෂ | හේ/ඔහු<br>ඕ/ඈ/ඇය<br>ළමයා<br>අම්මා<br>ගෙවිලිය<br>අම්බරුවා<br>කුරුල්ලා<br>සමනලයා<br>රිලවා | ඔවුහු<br>ඔවුහු<br>ළමයි<br>අම්මලා<br>ගෙවිලියෝ<br>අම්බරුවෝ<br>කුරුල්ලෝ<br>සමනල්ලු<br>රිලවු |

## ලිඛිත අභ්‍යාස

1. i. පහත දැක්වෙන අංක 01 රූපයේ ඇතුළත්ව ඇති නාම පද, නියමිත වර්ගයට අනුව අංක 02 රූපය තුළ සඳහන් කරන්න.

නාගයා, ඔබ, ගුරුතුමා, තොපි,
නුඹ, අපි, වෛද්‍යවරයා, මම,
පූජකතුමා, හෙදිය,
කම්කරුවෝ, නීතිඥයා, නිළිය,
නුඹලා, ලේකම්තුමා, ක්‍රීඩකයෝ

01 රූපය

උත්තම පුරුෂ ක්‍රියා පද සමග යෙදෙන නාම පද

මධ්‍යම පුරුෂ ක්‍රියා පද සමග යෙදෙන නාම පද

ප්‍රථම පුරුෂ ක්‍රියා පද සමග යෙදෙන නාම පද

02 රූපය

## ලිඛිත අභ්‍යාස

**1.**

**I. උත්තම පුරුෂ ක්‍රියා පද සමග යෙදෙන නාම පද**

- ✓ අපි
- ✓ මම

**II. මධ්‍යම පුරුෂ ක්‍රියා පද සමග යෙදෙන නාම පද**

- ✓ ඔබ
- ✓ තොපි
- ✓ නුඹ
- ✓ නුඹලා

III. ප්‍රථම පුරුෂ ක්‍රියා පද සමග යෙදෙන නාම පද

- ✓ නාගයා
- ✓ ගුරුතුමා
- ✓ වෛද්‍යවරයා
- ✓ පූජකතුමා
- ✓ හෙදිය
- ✓ කම්කරුවෝ
- ✓ නීතිඥයා
- ✓ නිළිය
- ✓ ලේකම්තුමා
- ✓ ක්‍රීඩකයෝ

## III. ලිංග භේදය

- ස්ත්‍රීන් ගැන කියැවෙන නාම පද ස්ත්‍රී ලිංග හෙවත් ස්ත්‍රී වාචී නාම පද ලෙසත් පුරුෂයින් ගැන කියැවෙන නාම පද පුරුෂ ලිංග හෙවත් පුරුෂ වාචී නාම පද ලෙසත් හඳුන්වයි.
- අප්‍රාණවාචී නාම පද, නපුංසක ලිංග හෙවත් නපුංසක වාචී නාම පද වෙයි.
- පුරුෂ වාචී නාම පද, ස්ත්‍රී වාචී නාම පද බවට හරවා ගන්නා විධි කීපයකි.

**1.** ක්‍රමය.

උදා -

| | | |
|---|---|---|
| කුමරා | - | කුමරි |
| මැති | - | මැතිනි |
| රජ | - | රැජිනි |
| දරුවා | - | දැරිවි |
| නයා | - | නැයිනි |

**2.** ක්‍රමය.

උදා -

| | | |
|---|---|---|
| එළුවා | - | එළු දෙන |
| සිටු | - | සිටු දේවි |
| හංසයා | - | හංස ධේනුව |
| සිංහයා | - | සිංහ ධේනුව |
| ව්‍යාඝ්‍රයා | - | ව්‍යාඝ්‍ර ධේනුව |
| නරියා | - | නරි දෙන |

3. ක්‍රමය.

උදා -

| | | |
|---|---|---|
| ළමයා | - | ගැහැනු ළමයා |
| මහත්මයා | - | නෝනා මහත්මයා |
| පිරිමි සතා | - | ගැහැනු සතා |

4. ක්‍රමය.

උදා -

| | | |
|---|---|---|
| එළුවා | - | එළිච්චී |
| මීයා | - | මීච්චී |
| දෙමලිච්චා | - | දෙමලිච්චී |

5. ක්‍රමය.

උදා -

| | | |
|---|---|---|
| අශ්වයා | - | වෙළඹ |
| මොනරා | - | සෙබඩ |
| රජ | - | බිසව |
| අලියා | - | කෙනෙර |

6. ක්‍රමය.

උදා -

| | | |
|---|---|---|
| සොර | - | සෙර |
| කවුඩු | - | කැවිඩි |
| කුකුළු | - | කිකිළි |
| බමුණු | - | බැමිණි |

**ලිඛිත අභ්‍යාස**

1. පහත සඳහන් පුරුෂ වාචී නාම පදවල ස්ත්‍රී වාචී නාම පද ලියන්න.

| | | | |
|---|---|---|---|
| ඉබ්බා | - | ලේඛක | - |
| කුරුල්ලා | - | පිරිමි | - |
| වස්සා | - | කපුටා | - |
| පුතා | - | ඇතා | - |
| අලියා | - | නරියා | - |

## ලිඛිත අභ්‍යාස (Home Work)

1.

| | | | | | |
|---|---|---|---|---|---|
| ඉබ්බා | - | ඉබ්බි | ලේඛක | - | ලේඛිකා |
| කුරුල්ලා | - | කිරිල්ලී | පිරිමි | - | ගැහැනු |
| වස්සා | - | වැස්සී | කපුටා | - | කපුටි |
| පුතා | - | දුව | ඇතා | - | ඇතින්න |
| අලියා | - | කෙනර | නරියා | - | නරි දෙන |

## ප්‍රායෝගික අභ්‍යාස (Home Work)

### ප්‍රායෝගික අභ්‍යාස

1. ස්ත්‍රී වාචී පද, පුරුෂ වාචී පද හා නපුංසක වාචී පද වෙන් වෙන් වශයෙන් වර්ග කරමින් කුඩා පොතක් සකස් කරන්න.

2. ස්ත්‍රී වාචී, පුරුෂ වාචී හා නපුංසක වාචී පද සඳහන් පුවරු බිත්තියේ ප්‍රදර්ශනය කරන්න.

3. තද කළු අකුරෙන් මුද්‍රිත වචන කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් වාක්‍ය කියවන්න.

මම සරුංගලය යවමි.
අපි සරුංගල් යවමු.
නුඹ පොත බලහි.
නුඹලා පොත් බලහු.
ඔබ පත්තරය කියවහි.
නුඹලා පත්තර කියවහු.
සෙබළා රට රකියි.
සෙබළු රටවල් රකිති.
මල්ලී කමිසය අඳියි.
මල්ලිලා කමිස අඳිති.
සංගීත විශාරදයා ගීතය ගයයි.
සංගීත විශාරදයෝ ගීත ගයති.
මිනිසා දොර විවෘත කරයි.
මිනිස්සු දොරවල් විවෘත කරති.
වඩුවා ලී පතුර කපයි.
වඩුවෝ ලී පතුරු කපති.
තාරකාව ආලෝකය නො දෙයි.
තාරකා ආලෝකය නො දෙයි.
ලේනා කුඩුව තනයි.
ලේන්නු කුඩු තනති.

- **ගුරු අත් පොතෙන්... (ගුණාත්මක යෙදවුම්)**
  - ✓ වී ගොවිතැන නිරූපණය වන පින්තූර/වීඩියෝ දර්ශන
  - ✓ වී ගොවිතැන හා බැඳුණු වචන ලැයිස්තුවක්
  - ✓ වී ගොවිතැන පිළිබඳ පොත පත
  - ✓ නාම පදයක වචන භේදය, පුරුෂ භේදය, ලිංග භේදය නිරූපණය වන වගුවක්.
  - ✓ වාක්‍ය ලැයිස්තුවක්

නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10
කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

# නාලන්දා විද්‍යාලය - කොළඹ 10
## ඒකක පරීක්ෂණය - 2020
## සිංහල භාෂාව
## 7 ශ්‍රේණිය

**(4) ඒකකය**

## ඔයි රයිරේ ඔයි රාමා

- **පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු පද තෝරන්න.**

01.(i) කමත ........................... නමින් හඳුන්වයි.

(ii) අඩහැරයේ හඬ වෙල් යාය පුරා ...........................දුන්නේ ය.

(iii) කාන්තාවෝ ඇඹුල රැගෙන කමතට ........................... වූහ.

(iv) විලියම් මාමා ........................... අරගෙන ආවේය.

(v) ........................... පැමිණි ගොවින්ට අම්මා සංග්‍රහ කළාය.

( අත්කමට , අම්බරුවන් , කලවිට , දෝංකාර , සේන්දු )

**02. කමත් භාෂාවේ පහත සඳහන් යෙදුම් සඳහා කමතේ ව්‍යවහාරයේ යෙදෙන පද ලියන්න.**

(i) යතුර - ...........................

(ii) බැත - ...........................

(iii) ලියන්නාව - ...........................

(iv) කුඹල් ගෙඩිය - ...........................

(v) ඇඹුල - ...........................

(vi) පැගිරිබෝය - ...........................

(vii) සප්පායම - ...........................

(viii) ගිණි කැටති - ...........................

(ix) තහංචි - ...........................

(x) මුත්තෙට්ටුව - ...........................

(xi) අත්තම - ...........................

(xii) හීල් අඩුක්කුව - ...........................

(xiii) ඉපනැල්ල - ...........................

(xiv) බිස්ස - ...........................

(3) හිස්තැන් පුරවන්න.

(i) කැමෙන් පසු ඉතිරි අඩුම ........................... ගෙන යැමට කාන්තාවෝ සූදානම් වූහ.

(ii) කමත් භාෂාවේ දී ' වී ' ........................... නමින් හඳුන්වයි.

(iii) කුඹුරේ දී ආහාර අනුභව කිරීම ........................... යනුවෙන් හඳුන්වයි.

(iv) කමතේ දී ........................... දෑක සිරිමල් මුහුණ හකුළා ගෙන නැහැය ද වසා ගත්තේ ය.

(4) පහත දැක්වෙන එක් එක් නාම පදඅ යත් වන පුරුෂය ඉදිරියෙහි ( √ ) ලකුණ යොදන්න.

| | | උත්තම පුරුෂ | මධ්‍යම පුරුෂ | ප්‍රථම පුරුෂ |
|---|---|---|---|---|
| (i) | තොපි | | | |
| (ii) | ඔහු | | | |
| (iii) | ගුරුතුමා | | | |
| (iv) | අපි | | | |
| (v) | නුඹලා | | | |
| (vi) | මම | | | |
| (vii) | කවටයා | | | |
| (viii) | ගායකයෝ | | | |
| (ix) | පොත් | | | |
| (x) | මිනිසා | | | |
| (xi) | තෝ | | | |
| (xii) | හෙතෙම | | | |
| (xiii) | පැදුරු | | | |
| (xiv) | සිංහයෝ | | | |
| (xv) | ගස් | | | |

(5) පහත සඳහන් වගුවෙහි හිස්තැනට සුදුසු පද යොදා වගුව සම්පූර්ණ කරන්න.

| | ඒක වචන | බහු වචන |
|---|---|---|
| (i) | සිංහයා | …………….. |
| (ii) | …………….. | පොත් |
| (iii) | මහල්ලා | …………….. |
| (iv) | …………….. | අත්කලා |
| (v) | ගස් | …………….. |
| (vi) | කඩය | …………….. |
| (vii) | …………….. | ලේන්නු |
| (viii) | අම්බරුවා | …………….. |
| (ix) | …………….. | බූලත් |
| (x) | ගොයම | …………….. |

(6) පහත සඳහන් වාක්‍යවලට සුදුසු ක්‍රියාපද යොදන්න.

(i) මම සරුංගලය ………………………..

(ii) නුඹ පොත ………………………..

(iii) ඔබ පත්තරය ………………………..

(iv) සෙබළු රටවල් ………………………..


(v) ලේන්නු කුඩු ………………………..

(vi) නුඹලා පත්තර ………………………..

(vii) අපි පොත් ………………………..

(viii) මිනිසා ගස ………………………..

# ඔයි රයිරේ ඔයි රාමා



**ලිඛිත අභ්‍යාස**

**01 පොදු ව්‍යවහාරයට ගැළපෙන කමත් ව්‍යයහාරයේ භාවිත වන වචන පහත කොටුවෙන් තෝරන්න.**

I හකුරු =

II තේ කහට =

III ගොයම් මිටක් =

IV බුලත් විට කෑම =

V ආප්ප =

| |
|---|
| රතු ගඟුල , උප්පිඩ |
| රස බෝය , ගොයියාව |
| කිරි කබළු , පැඟිරි බෝය පිරීම |

**02 සුදුසු පිළිතුර තෝරා යා කරන්න.**

| (අ) | (ආ) |
|---|---|
| I මුත්තෙට්ටුව | උදේ ආහාරය |
| II ඇඳුත්ත | ආහාර අනුභවය |
| III අත්තම | කමත් බත |
| IV හීල් අඩුක්කුව | උදව්වට වැඩ කර දීම |
| V සප්පායම | එකිනෙකාට ඇඳා ඇති හරක් |
| | පිරිසිදු සුදු රෙද්ද |

අන්තර්ගතය :- ඩබ් . කේ . ඩී .එස් .ශානුක මයා - වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව

සැකසුම :- ජී .කේ.එස් .ඩී .ජයරත්න - වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය

03 පහත ලබා දී ඇති නාම පද යොදා නිවැරදි ව වගුව සම්පූර්ණ කරන්න.

( නරි, අපි ,මා, රජු ,කම්කරුවෝ ,ප්‍රථමයා, ඔවුන් ,කරුමක්කාරයෝ ,තී,

අට්ටාලය ,දවටන, යුෂ්මතා, සාමාජිකයෝ ,කතුර, කඩය, සොරා)

| ඒක වචන | බහු වචන |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |
| | |

04 පහත දැක්වෙන නාම පද පුරුෂ භේදය අනුව වර්ග කර දක්වන්න.

| නාම පදය | අයත් වන පුරුෂය |
|---|---|
| තෝ | |
| නුඹලා | |
| සර්පයා | |
| අපි | |
| තෙපි | |
| අම්මා | |
| මම | |

05 නිවැරදි ස්ත්‍රී ලිංග හෝ පුරුෂ ලිංග පදය වරහනින් තෝරා ලියන්න.

( නිවේදකයා ,බාලිකා, රාක්ෂයා, සිසුවා, පිස්සියක, ඈ )

I ......................... වැරදි ලෙස නිවේදනය කළේ ය.

II ......................... මව ඉදිරියේ හඬා වැටුණා ය.

III සෙර ......................... මෙන් හැසිරුණා ය.

IV ......................... ළිපක් දැල්ලුවා ය.

V එම ......................... පාසලේ පැරණි ශොඩනැගිලි බොහෝ ය.

# මීගමුව අධ්‍යාපන කලාපය

විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය

ශ්‍රේණිය : 7

## 04 වන පාඩම

# ඔයි රයිරේ ඔයි රාමා

01. පහත සඳහන් වී ගොවිතැන හා බැඳුනු බස් වහර හා සිරිත් විරිත් මොනවාදැයි විස්තර කරන්න.

1). යතුර - .......................................

2). රතු ගගුල - .......................................

3). රස බෝය - .......................................

4). අරත් වළ - .......................................

5). පාවර - .......................................

6). කමත - .......................................

7). බැත වඩනවා - .......................................

8). අම්බරුවෝ - .......................................

9). කලාතයා - .......................................

10). මුදුනා - .......................................

11). කොළමුත්තා - .......................................

12). එළිවිස්සා - .......................................

13). මට්ටයා - ......................................

14). බොලත්ත - ......................................

15). සාත්තු වෙනවා - ......................................

02. අරක් වළ ආශ්‍රිතව සිදු කරන චාරිත්‍ර මොනවාද?

..............................................................................................................

..............................................................................................................

## නාම පද

01. නාම පද යනු කුමක්ද?

..............................................................................................................

..............................................................................................................

02. නාම පද කෙරෙහි බලපාන කරුණු මොනවාද?

..............................................................................................................

..............................................................................................................

03. වචන භේදය යනු කුමක්ද?

..............................................................................................................

..............................................................................................................

04. ඒක වචන යනු කුමක්ද?

..............................................................................................................

..............................................................................................................

05. බහු වචන යනු කුමක්ද?

..............................................................................................................

..............................................................................................................

06. පහත සදහන් නාමපදවලට බහු වචන නාම පද ලියන්න.

1). අම්මා - .......................................

2). කුඹුර - .......................................

3). කමත - .......................................

4). චාරිත්‍රය - .......................................

5). කුල්ල - .......................................

6). මල්ල - .......................................

7). අඩුක්කුව - .......................................

8). පුතා - .......................................

9). යතුර - .......................................

10). ගොයම - .......................................

07. පහත දැක්වෙන නාම පද වෙන්කර දක්වන්න.

(අම්බරුවා/ඔබ/ගුරුතුමා/නුඹ/අපි/මම/කුරුල්ලා/අම්මා/ළමයි/නුඹලා/මා/

වෛද්‍යවරයා/මඳුරුවෝ/ලේන්නු/ඉබ්බා)

| උත්තම පුරුෂ | මධ්‍යම පුරුෂ | ප්‍රථම පුරුෂ |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

08. පුරුෂලිංග නාම පද යනු මොනවාද?

.......................................................................................................................

.......................................................................................................................

09. ස්ත්‍රීලිංග නාම පද යනු මොනවාද?

.............................................................................................................

.............................................................................................................

10. අප්‍රාණවාචි හෙවත් නපුංසකලිංග නාම පද යනු කුමක්ද?

.............................................................................................................

.............................................................................................................

11. පහත සඳහන් පුරුෂලිංග නාම පද ස්ත්‍රීලිංග නාම පද බවට හරවන්න.

1). කුමරා - ......................................

2). රජ - ......................................

3). සිටු - ......................................

4). සිංහයා - ......................................

5). ළමයා - ......................................

6). එළුවා - ......................................

7). මොනරා - ......................................

8). සොරා - ......................................

9). වස්සා - ......................................

10). පිරිමි - ......................................


ගරු ක්‍රිෂාන්ති ප්‍රනාන්දු පැවිදි සොයුරිය

ශා.ජෝෂප් විද්‍යාලය - මීගමුව ශාඛාව

කඩොල් උයන

# පිළිතුරු



**Answer**

නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10 නාලන්දා විද්‍යාලය, කොළඹ 10 Nalanda Colllege,Colombo 10

## නාලන්දා විද්‍යාලය - කොළඹ 10
### ඒකක පරීක්ෂණය - 2020
### සිංහල භාෂාව
### 7 ශ්‍රේණිය

**1**

- **I.** කලවිට
- **II.** දෝංකාර
- **III.** සේන්දු
- **IV.** අම්බරුවන්
- **V.** අත්තමට

**2**

- **I.** කුල්ල
- **II.** වී
- **III.** දෑකැත්ත
- **IV.** කළය/වතුර භාජනය
- **V.** කමත් බත
- **VI.** බුලත් විට
- **VII.** ආහාර අනුභව කිරීම
- **VIII.** -
- **IX.** තහනම
- **X.** කමත් ආහාරය/කමත් බත
- **XI.** හිලව්වට ගොවිතැන් කටයුතු කිරීම
- **XII.** උදේ ආහාරය
- **XIII.** ගොයම් කැපීමෙන් පසු ගොයම් ගසේ ඉතිරි කොටස
- **XIV.** ධාන්‍ය තැන්පත් කර තැබීමට සකසන විශාල පෙට්ටිය

**3**

- **I.** කුඩුම
- **II.** බැත
- **III.** සප්පායම් වෙනවා/ සාත්තු වෙනවා
- **IV.** ගොම්පස්

**4**

I. මධ්‍යම පුරුෂ
II. ප්‍රථම පුරුෂ
III. ප්‍රථම පුරුෂ
IV. උත්තම පුරුෂ
V. මධ්‍යම පුරුෂ
VI. උත්තම පුරුෂ
VII. ප්‍රථම පුරුෂ
VIII. ප්‍රථම පුරුෂ
IX. ප්‍රථම පුරුෂ
X. ප්‍රථම පුරුෂ
XI. මධ්‍යම පුරුෂ
XII. ප්‍රථම පුරුෂ
XIII. ප්‍රථම පුරුෂ
XIV. ප්‍රථම පුරුෂ
XV. ප්‍රථම පුරුෂ

**5**

I. සිංහයෝ
II. පොත
III. මහල්ලෝ
IV. අක්කා/ අත්තා
V. ගස
VI. කඩ
VII. ලේනා
VIII. අම්බරුවෝ
IX. බුලත
X. ගොයම්

**6**

I. කියවමි
II. කියෙව්වෙහි
III. බැලුවෙහි
IV. අල්ලති
V. සාදති
VI. බැලුවෙහු
VII. කියෙව්වෙහු
VIII. කපයි

## ඔයි රයිරේ ඔයි රාමා

### පිළිතුරු පත්‍රය

### ලිඛිත අභ්‍යාස

01 I රස බෝය

II රතු ගඟුල

III උප්පිඩ

IV පැඟිරි බෝය පිරීම

V කිරි කබළු

02 I කමත් බත

II එකිනෙකාට ඇඳා ඇති හරක්

III උදව්නට වැඩ කර දීම

IV උදේ ආහාරය

V ආහාර අනුභවය

03 ඒක වචන = මා, ප්‍රථමයා, රජු, තී, අට්ටාලය ,යුෂ්මතා, කතුර, කඩය, සොරා

බහු වචන = නරි, අපි ,කම්කරුවෝ, ඔවුන්, කරුමක්කාරයෝ ,දවටන, සාමාජිකයෝ

04 I මධ්‍යම පුරුෂ II මධ්‍යම පුරුෂ

III ප්‍රථම පුරුෂ IV උත්තම පුරුෂ

V මධ්‍යම පුරුෂ

VI ප්‍රථම පුරුෂ

VII උත්තම පුරුෂ

05 I නිවේදකයා IV ඈ

II සිසුවිය V බාලිකා

III පිස්සියක

අන්තර්ගතය :- ඩබ් . කේ . ඩී .එස් .ශානුක මයා - වේල්ස් කුමර විද්‍යාලය - මොරටුව

සැකසුම :- ජී .කේ.එස් .ඩී .ජයරත්න - වීරකැටිය රාජපක්ෂ මධ්‍ය විද්‍යාලය

## මීගමුව අධ්‍යාපන කලාපය

විෂයය : සිංහල භාෂාව හා සාහිත්‍යය

ශ්‍රේණිය : 7

1

I. කුල්ල
II. තේ කහට
III. හකුරු
IV. අරක් වස්තු තැන්පත් කරන්නට කමතේ හාරන වළ
V. ගොයම් පාගන්න පැදුරු එළලා තියන තැන
VI. කොළ මඩවන මුළු බිම
VII. කමත පුරා වී ඉහින චාරිත්‍රය
VIII. හරක්
IX. ඇඳුත්තේ අන්තිමයා
X. ඇඳුත්තේ නායකයා
XI. ඇඳුත්තේ දෙවැනියා
XII. ඇඳුත්තේ තෙවැනියා
XIII. ඇඳුත්තේ සිව්වැනියා
XIV. කමත අතු ගාන ඉදල
XV. කනවා

2

I. අරක් වස්තු තැන්පත් කිරීම
II. වැඳුම් පිදුම් කිරීම
III. අටමගල/අළුහන් වැඩීම
IV. උප්පිඩ බැගින් ගෙන අරක් වළ වසා ඇති සුදු පිරුවටය මත තබා වී කරල් අතින් පොඩි කර ගොයමින් වෙන් කර ගත් වී ඇට කමත පුරා ඉසීම.

# නාම පද

1 සචේතනික හා අචේතනික සියලු වස්තු හඳුන්වන පද

2 වචන භේදය (සංඛ්‍යා භේදය), පුරුෂ භේදය, ලිංග භේදය

3 එක් අයකු හෝ එක් දෙයක් හෝ හැඳින්වෙන නාම පද ඒක වචන නාම පද ලෙසත් එක් දෙයකට වැඩියෙන් ඇති දේවල් හෝ එක් අයෙකුට වැඩියෙන් සිටින කණ්ඩායමක් හෝ හැඳින්වීමට යොදන නාම පද, බහු වචන නාම පද ලෙසත් හැඳින්වේ. මෙය වචන භේදයයි.

4 එක් අයකු හෝ එක් දෙයක් හෝ හැඳින්වෙන නාම පද.

5 එක් දෙයකට වැඩියෙන් ඇති දේවල් හෝ එක් අයෙකුට වැඩියෙන් සිටින කණ්ඩායමක් හෝ හැඳින්වීමට යොදන නාම පද

6

I. අම්මලා
II. කුඹුරු
III. කමත්
IV. චාරිත්‍ර
V. කුළු
VI. මලු
VII. අඩුක්කු
VIII. පුත්තු
IX. යතුරු
X. ගොයම්

7

I. උත්තම පුරුෂ - මම, අපි, මා
II. මධ්‍යම පුරුෂ - ඔබ, නුඹ, නුඹලා
III. ප්‍රථම පුරුෂ - අම්බරුවා, ගුරුතුමා, කුරුල්ලා, අම්මා, ළමයි, වෛද්‍යවරයා, මඳුරුවෝ, ලේන්නු, ඉබ්බා

8 පුරුෂයින් ගැන කියැවෙන නාම පද පුරුෂ ලිංග හෙවත් පුරුෂ වාචී නාම පද වෙයි

9 ස්ත්‍රීන් ගැන කියැවෙන නාම පද ස්ත්‍රී ලිංග හෙවත් ස්ත්‍රී වාචී නාම පද වෙයි.

10 අප්‍රාණවාචී(පණ නැති) පුරුෂ ලිංග හෝ ස්ත්‍රී ලිංග නොවන නාම පද

11

I. කුමරිය
II. රැජින/ බිසව
III. සිටු දේවිය
IV. සිංහදේනුව
V. ගැහැනු ළමයා
VI. එළිච්චී
VII. සෙබඩ
VIII. සෙර
IX. වැස්සී
X. ගැහැනු



අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුළු සිංහල ගණිතය සහ විද්‍යාව විෂය වලට අයත් මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා මෙම නිබන්ධනය යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.

අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.

**ස්තූතියි !**

**හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**



3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ